# 2022 ජුනි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 ජුනි මස මාසික සභා රැස්වීම 2022.06.09 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් නවක මන්ත්‍රීතුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.05.23 වන දින මාසික සභා රැස්වීම් වාර්තාවේ වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම වාර්තා ගත වීමේදී මැයි මස 09 වන දින අරගල භූමියට සිදු කල පහර දීම හෙලා දකින බවත්,ඒ සම්බන්ධව තමන් විසින් දැඩි විරෝධතාවක් දැක්වූ අතර එය වාර්තා වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළේය.එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රෝහණ විජේරත්න මැතිතුමා විසින් වෙනත් කරුණු යටතේ තම අදහස් දැක්වීමේ දී ජනතාව මෙසේ පීඩාවට පත් වී අරගල කිරීමට පෙළඹීමට ප්‍රධාන හේතුව දේශපාලන නායකයින් ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ගේ හඬට ඇහුම්කන් නොදීම බව සඳහන් කළද එය වාර්තා ගතව නොමැති බව සඳහන් කරන ලදී.තවද වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමාගේ අදහස් දැක්වීමේ මැයි 9 වන දින සිදු වූ සිදුවීම තරයේ හෙලා දකින බව සඳහන් කර ඇති නමුත් එය එම සිදුවීම අනුමත නොකරන ලද බවට සංශෝධනය විය යුතු බවත්,එම අවස්ථාවේ තම ආරක්ෂාව සම්බන්ධව සොයා බැලූ වැලිගෙපොල පොලිස් ස්ථානාධිපතිතුමන්ට සිය ස්තූතිය පල කිරීම වාර්තා ගතවී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළේය.ඒ අනුව ඉහත

සංශෝධනයන්ට යටත්ව 2022.05.23 මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපතිතුමාගේ නිවේදන</u>

### 2.1. ජල බිල් පතේ නම සංශෝධනය කිරීම

- ඩබ්.එම්.එම්.එම්.පියරත්න නමින් ඇති අංක NG – 252 දරණ ජල බිල් පත ඩබ්.එම්.එම්.එම්.නිම්මි නදීශා වීරරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3. <u>සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. වතුකන්ද මාර්ගයේ වංගු සහිත ස්ථානය පුළුල් කර ගැනීම සම්බන්ධවයි

ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එච්. සිරිපාල මන්ත්‍රිතුමා විසින් සභාව සතු JCB යන්ත්‍රය පැය තුනකට පමණ ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.3. සුසාන භූමියේ තිබෙන කටු පඳුරු ඉවත් කර ගැනීම සඳහා අවසර ලබා ගැනීම

මුත්තෙට්ටුපොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති මුත්තෙට්ටුපොල සුසාන භූමියේ ඉතා විශාල කටු පඳුරු වැවී ඇති අතර ඉතා සුළු ප්‍රමාණයක් භූමදාන කටයුතු සඳහා යොදා ගන්නා බැවින්, ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වයෙන් කටු පඳුරු ඉවත් කර ගැනීම සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවිය

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

## 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ගලි බවුසර් සේවාව සඳහා කේ.එල්.ගිහාන් චතුරංග ලේකම්ගේ යන අය විසින් ගෙවූ රු.5750.00 ක මුදල ආපසු ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ,ඉහත නම් සඳහන් අය විසින් ගලි බවුසර් සේවාව ලබා ගැනීම සඳහා මුදල් තැන්පත් කලද,එම එම ස්ථානයේ පැවති දෝෂ හේතුවෙන් එම සේවාව සැපයීමට නොහැකි වූ බැවින්, ඔහුගෙන් ලබා ගත් මුදල් ආපසු ලබා දිය යුතු බව ප්‍රකාශ කළේය.එම සේවාව සැපයීම සඳහා වූ ප්‍රවාහන වියදම තබා ගනිමින් ඉතිරි මුදල ආපසු ගෙවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් සඳහන් කරන ලදී.රු. 1600.00 ක මුදලක් ප්‍රවාහන ගාස්තු ලෙස අයකරගත් බවත්,ඉතිරි රු. 5750.00 පමණක් ආපසු ගෙවීම් කරන බවත් ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කිරීමෙන් පසු එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

II. ශ්‍රී ලංකා අමරපුර නිකායේ මහ නායක, කන්දේ පුරාණ රජමහා විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය කුරුවිට ශ්‍රී රාහුල භද්‍ර සරණංකර ස්වාමීන්වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් තොරණ සැකසීම සඳහා වැය වූ රු.56,000.00ක් සභා අරමුදලින් ලබා දීම සඳහා අනුමැතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සහා සම්මත විය.

III. ඕපනායක පොළ ඉදිරිපිට කඩකාමර 08 ,ගල්පාය කඩ කාමර 05,පෙළගෙවත්ත ඉඩම් 07,පැරණි දුම්රිය පාරේ ඇති ගොඩනැගිල්ල සහ ඕපනායක පොළ ඉදිරිපිට අංක 08 කාමරයට යාබද කොටස සඳහා මැයි මස අධි ගාස්තු නිදහස් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී සියළු ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම් වලට අනුව අධි ගාස්තුව සාපේක්ෂ වශයෙන් ඉතා අඩු අගයක් ගන්නා බැවින් එය කපා හැරීම අවශ්‍ය නොවන බවට තීරණය වූ අතර මැයි මස අධි ගාස්තු කපා හැරීමේ යෝජනාව සභා සම්මත නොවිණ.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. අකරැල්ල - බෝගහකුඹුර තලාව දක්වා මාර්ගය පස් කපා පුළුල් කිරීම සඳහා JCB යන්ත්‍රය දිනකට ලබා ගැනීම අවශ්‍ය බවත්,

II. වල්ලකැටිය වසමේ වල්ලකැටිය ගම සඳහා කියවීම් ශාලාවක් ආරම්භ කිරීම සුදුසු බවත් ඒ සඳහා වසා දමා ඇති වල්ලකැටිය පාසල් ගොඩනැගිල්ල යොදා ගත හැකි බවත් යෝජනා කරන ලදී.

ඉහත I හා II යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. කාරක සභා වාර්තා සලකා බැලීම.

### 6.1. 2022.05.23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.05.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 6.2. 2022.05.23 වන දින ප්‍රසම්පාදන වාර්තාව

2022.05.23 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2022 අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 717,087.45 | වැටුප් හා දීමනා | 3,364,287.44 |
| කුලී | 119,282.63 | ගමන් වියදම් | 53,500.00 |
| බලපත්‍ර ගාස්තු | 163,250.00 | සැපයුම් හා උපකරණ | 658,914.00 |
| සේවා සඳහා ගාස්තු | 93,022.99 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 262,778.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 398,097.00 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 376,606.92 |
| වෙනත් ආදායම් | 33,285.03 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 109,673.63 |
| වෙනත් ආධාර | 2,793,069.30 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 4,317,094.40 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 37,212.18 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 4,862,972.17 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 218,000.00 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 4,317,094.40 | ණය ආපසු ගෙවීම් | 122,389.12 |
| සේවක ණය | 68,564.67 | සේවක ණය | 590,000.00 |
| තැන්පත් | 182,483.80 | තැන්පත් | 15,000.00 |
| අත්තිකාරම් | 640.00 | ණයහිමි | 2,475,009.98 |
| ණය ගැති(කර්මාන්ත) | 2,475,010.00 | අත්තිකාරම් | 20,000.00 |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | 65,828.60 |
| | | ගබඩා(ඖෂධ) | 65,828.60 |
| වෙනත් ලැබීම් එකතුව | 2,726,698.47 | සමුච්චිත අරමුදල | 200,000.00 |

| | | | |
|---|---|---|---|
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 3,365,838.58 |
| මුළු එකතුව | 7,043,792.87 | මුළු ගෙවීම් | 8,569,199.87 |

### 7.2. 2022 අප්‍රේල් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසු ගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා,ප්‍රදේශයේ වගා නොකල මුඩු ඉඩම් වගාකරුවන් වෙත ලබා දී මෙම කඩා වැටී ඇති කෘෂි ආර්ථිකය නැංවීමට ක්‍රියා කල යුතු බව පැවසූ අතර වැලිගෙපොල සුවදනෙළුම්ගම ඉඩම් කට්ටි කර වෙන්දේසි කිරිම සිදුවන බවට කරුණු අනාවරණය කරමින් ඒ සම්බන්ධව සභාවේ දැනුවත් භාවය විමසා සිටියේය.එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා එම ඉඩම් කට්ටි කිරීම සභාවේ නීතිරීති වලට අනුකූලව සිදුවන බව සඳහන් කළේය.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

බෙලිමාලියද්ද,තිත්තවැල්කුණ්ඩිය,හදගිරිය යන ප්‍රදේශ වල ජනතාව ගොවිතැන්බත් කරමින් ඉතා දුෂ්කරව තම ජීවිකාව ගෙවන අතර නිරන්තරව වන අලි ගම් වැදී ගොවීන්ගේ වගාවන්ට හා දේපළ වලට නිරන්තරයෙන් හානි සිදු කිරීම හේතුවෙන් පීඩා විදින බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, වනජීවී නිලධාරීන් ඒ සම්බන්ධව මේ වන තෙක් විසඳුම් ලබාදීමට අපොහොසත් වී ඇති බවත්, ජනතාවගේ මුදලින් වැටුප් ලබන නිලධාරීන් ජනතාව මුහුණ දෙන මෙම ගැටළුව සම්බන්ධයෙන් මෙසේ ක්‍රියා කිරීම ඉතා කණගාටුවට කරුණක් බවත්, පැවසුවේය.එසේම ගරු මන්ත්‍රීතුමා,ඉදිරියටත් මේ සම්බන්ධයෙන් කිසිදු විසඳුමක් ලබා නොදෙන්නේ නම් ප්‍රදේශයේ ජනතාව සමඟ එක්ව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කළේය.

තවද,බල ප්‍රදේශයේ වගා නොකරන මුඩු ඉඩම් වගා කටයුතු සඳහා ගොවීන් වෙත ලබා දෙන වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය ලේකම් හරහා සිදුකිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.තවද, බලංගොඩ මාර්ග සංවර්ධන අධිකාරිය සතුව භූමිතෙල්, පෙට්‍රල් සහ ඩීසල් තොග අතිරික්තව පවතින බවට විශ්වාසනීය ආරංචිමාර්ග වලින් තොරතුරු ලැබී ඇති අතර මේ දිනවල මාර්ග සංවර්ධන කටයුතු ද නවතා දමා ඇති බැවින්, ඔවුන් සතුව ඇති මෙම තොග මහජනතාවට ලබා දීමේ සුදුසු වැඩපිළිවෙළක් සකස්කල යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

රටේ දේශපාලන නායකයින්ගේ අත්තනෝමතික ක්‍රියාවන් හේතුවෙන් රටට මෙවන් තත්ත්වයක් උදා වී ඇති බවත්, මේ සඳහා දේශපාලන අධිකාරිය මෙන්ම රජයේ නිලධාරීන් ද වගකිව යුතු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා බොහෝ රාජ්‍ය සේවකයින් තම රාජකාරි නිසි ලෙස ඉටු නොකරන බවත් ගන්නා

වැටුපට සරිලන සේවාවක් ලබා නොදෙන බවත් දැඩි ලෙස විවේචනය කරමින් ආවේගශීලීව සිය අදහස් ඉදිරිපත් කළේය.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරීන් එක්ව ප්‍රදේශයේ මුඩු ඉඩම් වගා කටයුතු සඳහා ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බැවින්, එම ඉඩම් වගා කිරීම සඳහා සුදුසු පුද්ගලයින් වෙත ලබාදීමේ වැඩසටහනක් සකස් කළ යුතු බව පෙන්වා දුන් ගරු මන්ත්‍රිතුමා, රැකියා ලක්ෂය වැඩසටහන යටතේ තම ප්‍රදේශයේ පාසල් සඳහා යොදවා ඇති සේවකයින් ඔවුන්ගේ රාජකාරී නිසි ලෙස ඉටු නොකරන බවත් පාසලේ පවිත්‍රතා කටයුතු සඳහා ඔවුන් සිටියදී දෙමව්පියන්ටද වෙහෙසීමට සිදුවන බවත් ප්‍රකාශ කල අතර වැටුප් ලබමින් මෙම තනතුරට බඳවා ගන්නා ලද සේවකයින්ගේ වැඩ රාජකාරි අධීක්ෂණයන් නිසි පරිදි සිදු කල යුතු බවට අදහස් ප්‍රකාශ කරන ලදී.

අවසාන වශයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා වන අලි ගැටළුවට මෙතෙක් කිසිදු විසඳුමක් ලබා දී නොමැති බැවින් ඒ සඳහා වහා විසඳුම් ලබා දෙන ලෙස නැවතත් ඉල්ලා සිටියේය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

සභාවේ පුරප්පාඩු වූ මන්ත්‍රී තනතුර සඳහා පත් වූ තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය ට සිය සුභ පැතුම් එක් කරමින් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා ,පසුගිය දින වෙළඳපළේ සහල් අලෙවි කිරීමේ දී වෙළඳුන් විසින් එක් දිනක් තුල සහල් මිල ඉතා විශාල ලෙස ඉහල දමමින් අලෙවි කර ඇති බවට කරුණු අනාවරණය කල අතර මෙසේ රටේ පවතින තත්වය අයථා ලෙස ප්‍රයෝජනයට ගනිමින් වෙළඳුන් විසින් කළුකඩ මිලක් නිර්මාණය කරන අතර බල ප්‍රදේශය තුල හෝ මෙම තත්වය පාලනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කල යුතු බව ප්‍රකාශ කළේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

අකරැල්ල කොට්ඨාශය නියෝජනය කරමින් පුරප්පාඩු වූ මන්ත්‍රී තනතුර පිරවීමට පත්කර ඇති තමරා කුමාරි යටිකිඳ මැතිතුමියට සිය සුබ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා රට මේ වන විට දරුණු ඛේදවාචකයකට මුහුණ දී සිටින බවත්, ශාන්ත මැතිතුමා සඳහන් කල ආකාරයට පසුගිය දිනක වෙළඳපලේ සහල් මිල එක් දිනක් තුල විශාල ලෙස ඉහළ දමමින් වෙළඳුන් විසින් කළුකඩ මිලක් නිර්මාණය කරමින් සහල් අලෙවිය සිදුකල බව සඳහන් කළේය. මෙසේ රට තුල අත්‍යවශ්‍ය භාණ්ඩයන්ගේ මිල පාලනය සිදු කරගත නොහැකි වීමෙන් පිළිබිඹු වන්නේ පවතින ආණ්ඩුවේ අස්ථාවරත්වය බවත්, මේ තත්ත්වය ඇමතිධූර වෙනස් කිරීමෙන් විසදිය නොහැකි බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා මූලික වශයෙන් සිදු විය යුත්තේ මොනයම් ක්‍රමයකින් හෝ ස්ථාවර ආණ්ඩුවක් ගොඩනැගීම බව වැඩි දුරටත් පෙන්වා දෙන ලදී.

එසේම ලාල් කුමාරරත්න මැතිතුමා විසින් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව සිදු කල විවේචන තමන් විසින් හෙළා දකින බව පැවසූ අතර බහුතර රාජ්‍ය නිලධාරීන් තමාට පැවරී ඇති රාජකාරි ලැයිස්තුවකට අනුව තම රාජකාරි ඉටුකරන බවත්, ඊට පරිබාහිරව රාජකාරිය ඉටු කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට බලතල හිමි වී නොමැති බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, නිලධාරීන්ගෙන් කාර්යක්ෂමතාවයකින් යුතුව කාර්යන් ඉටු කරගැනීම ආයතන ප්‍රධානීන් හා මධ්‍යම රජයෙන් නිති රෙගුලාසි අනුව සකස් කරන ලද රාජකාරි ලැයිස්තු වලට අදාලව ඉටුකරගත යුතු බව පෙන්වා දුන්නේය. එසේම වනජීවී දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පවතින ගැටළු ඔවුන්ගේ මට්ටමින් සිදු කරගත නොහැකි නම් පාර්ලිමේන්තුව මඟින් නව නීති සම්පාදනය සිදු කරමින් මෙම වන අලි ගැටලුව විසඳීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු බව ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

තවද, සියලු දෙනා වගාකිරීමට පෙළඹීම මේ දිනවල සිදුකරන අතර වෘත්තීමය වශයෙන් වගාවන් සිදුකල ගොවීන්ගේ වගා කටයුතු අඩාල කරමින් අනෙකුත් පුද්ගලයින් ධෛර්යමත් කිරීම ඵල රහිත බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, මීට කාලයකට ඉහත දී තමන් විසින් රට තුල ආහාර භියක් ඇතිවිය හැකි බව ප්‍රකාශ කල නමුත් එහිදී සියලු දෙනා එය පිළිනොගත් අතර මේ වන විට එය සත්‍ය වී හමාර බවත් රටේ පවතින මෙම ගැටළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සන්නිවේදනය කර ඒවාට අවශ්‍ය විසඳුම් ලබා ගන්නා ලෙසත් ඉල්ලා සිටියේ ය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

ප්‍රථමයෙන් සභාවට පත්වූ නව කාන්තා නියෝජනය වෙනුවෙන් තමරා කුමාරි යටිකිඳ මැතිතුමියට සිය සුබ පැතුම් එක් කළ ගරු මන්ත්‍රීතුමිය, රටේ පවතින දේශපාලනික තත්ත්වය සාකච්ඡා කිරීම ඵල රහිත වන බැවින් ඒ සම්බන්ධව තමන් සාකච්ඡාවට බඳුන් නොකරන බවත්, ඉලුක්කුඹුර තේ කඩය අසලින් ඇති මාර්ගය සංවර්ධනය සඳහා එක් දිනකට JCB යන්ත්‍රය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටියාය.

එසේම මේ දිනවල අධික ලෙස සීනි මිල ඉහළ ගොස් ඇති බැවින්, එයට විසඳුමක් ලෙස ප්‍රදේශයේ කිතුල් හකුරු නිෂ්පාදනය දිරිගැන්වීම සිදු කල යුතු බවත්, වැලිගෙපොල ප්‍රදේශයේ තැබැරුම් හේතුවෙන් විවිධ අපහසුතාවන්ට ප්‍රදේශවාසීන් මුහුණ දෙන අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ද ඉහළ ගොස් ඇති බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමිය මෙයට විසඳුමක් ලෙස කිතුල් රා සහ පොල් රා නිෂ්පාදනය සඳහා නීති ලිහිල් කල යුතු බව ගරු මන්ත්‍රී තුමිය විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

අකරැල්ල කොට්ඨාශය නියෝජනය කරමින් පුරප්පාඩු වූ මන්ත්‍රී තනතුරට පත්වූ තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය ට සිය සුබ පැතුම් එක් කරමින් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා කහවත්ත වතු සමාගමේ අකරැල්ල වතුයායේ මුඩු ඉඩම් වතු අධිකාරි සමග සාකච්ඡා කර ගිවිසුම් ගත වී හෝ වගාවන් සඳහා ජනතාව වෙත ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස ඉල්ලා සිටි අතර එසේ නොවන්නේ නම් ජනතාව අනවසරයෙන් එම ඉඩම් අල්ලා ගැනීමට පෙළඹෙන බවත් එහිදී නීති ක්‍රියාත්මක කිරීමට යාමේදී ජනතාව සමඟ ගැටුම් ඇති විය හැකි බැවින් එය වළක්වා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බවත් සඳහන් කළේය.

තවද, උඩවෙල අකරැල්ල මාර්ගයේ අබලන් වී ඇති කොටස් ඇති බැවින් මාර්ග අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර කඩිනමින් විසඳුම් ලබාදීමට කටයුතු කරන ලෙස අවසාන්න වශයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ අභාවය හේතුවෙන් පුරප්පාඩු වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රී තනතුරට පත්වූ තමරා කුමාරි යටිකිඳ මැතිතුමියට ඉසුරුමුණි මැතිතුමා සිදුකළ මෙහෙය ඉදිරියට සිදු කරගෙන යාමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, අදහස් දැක්වීම ආරම්භ කල ගරු මන්ත්‍රීතුමා රංවල ප්‍රදේශය හරහා මහරගම දක්වා ධාවනය වූ ලංගම බස් රථය රංවල ප්‍රදේශයේ නවතා තිබියදී එහි ඇති ඩීසල් සොරාගෙන ඇති අතර ගොඩකවෙල පොලිසිය විසින් ඒ සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කරන අතර මේ වන තෙක් සොරාගත් පුද්ගලයින් සොයාගෙන නොමැති බැවින් මහරගම ඩිපෝවට අයත් මෙම බස් රථය ගොඩකවෙල ඩිපෝ අධිකාරී විසින් රංවල ප්‍රදේශය හරහා ධාවනය කිරීම නවතා ඇති බැවින් එම ප්‍රදේශයේ පාසල් ළමුන්, රාජකාරිය සඳහා පිටත් වන්නන් සහ ප්‍රදේශවාසීන් මේ දිනවල දැඩි අපහසුතාවයට ලක් වී ඇති අතර එම බස් රථය නැවත ධාවනය කරවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටියේය.

තවද , වසර හතරක කාලයක් පුරා ප්‍රාදේශීය සභාව තුල විවිධ තර්ක විතර්ක සිදු කරමින් සහෝදරත්වයෙන් පක්ෂ භේදයකින් තොරව සියළු ගරු මන්ත්‍රීතුමන්ලා කටයුතු කල අතර ඉදිරියටත් පවතින කෙටි කාලය තුල රටේ උද්ගතව ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට සියළු දෙනා සහයෝගයෙන් කටයුතු කල යුතු බව ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා, ප්‍රදේශයේ ජනතාව උදෙසා සියළු දෙනා එකමුතුව සේවය කල යුතු බවත් සඳහන් කළේය.මේ දිනවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා රුපියල් පන්දහසේ දීමනාවක් ලබාදීමට කටයුතු කරන බැවින් එම දීමනාව සාධාරණ ලෙස බෙදී යන්නේ ද යන්න සොයා බලා යම් අසාධාරණයක් සිදු වන්නේ නම් එයට මැදිහත් වී සාධාරණයක් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් සියලු දෙනාගෙන් ඉල්ලා සිටින ලදී.

## 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා

මේ දිනවල ජලභීතිකා රෝගය සීග්‍රයෙන් පැතිරී යන බවත් රෝහල්වල ඒ සඳහා භාවිතා කරන එන්නත් හිඟයක් පවතින බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමිය ඌරාවල ප්‍රදේශයේ අයාලේ යන සුනඛයන් විශාල ප්‍රමාණයක් සිටින අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හරහා හෝ මෙම සුනඛයින් එන්නත් කිරීමට භාජනය කර ඒ සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියාය.

තවද, පසුගිය දිනක වැලිගෙපොල රෝහලට රාත්‍රියේ දී හදිසි රෝගියකු ඇතුලත් කිරීමේදී ඔහුගේ තත්ත්වය මත වෙනත් රෝහලකට රැගෙන යාමට ගිලන් රථයේ රියදුරු නොසිටීම හේතුවෙන් විශාල අවදානමකට රෝගියා පත් වූ බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමිය ඒ සම්බන්ධව සොයා බලා ගිලන් රථ රියදුරු නිසි ලෙස රාජකාරියේ යොදවා ගන්නා ලෙස අදාල පාර්ෂව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියාය.

## 9.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව සභාවේ සිදු වූ විවේචන තමන් විසින් හෙලා දකින බව පැවසූ මන්ත්‍රීතුමා, බොහෝ රාජ්‍ය නිලධාරීන් පසුගිය කොරෝනා වසංගත තත්ත්වය හමුවේ තම රාජකාරිය ඉතාමත් කැපවීමෙන් ඉටු කල බවත්, ඔවුන්ට පැවරී ඇති විෂය පථය තුල විශාල කැපකිරීමක් සිදු කරන බවත් පෙන්වා දුන්නේය. වසර 74ක දේශපාලන ඉතිහාසයේ විවිධ තීන්දු තීරණ රාජ්‍ය සේවය කඩා වැටීමට හේතු වූ බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, රට පත්වී ඇති පරිහාණියට වසර 74 ක දේශපාලන තන්ත්‍රය වගකිවයුතු බව සඳහන් කළේය.

එසේම ප්‍රදේශයේ මුඩු ඉඩම් වගා කිරීම සඳහා සුදුසු පුද්ගලයින් සොයා බලා ලබාදීමේ වැඩසටහන කඩිනමින් සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

තවද, ගරු සභාපතිතුමා විසින් මෙම ධුර කාලය තුල සභාව සංවර්ධනය සඳහා සිදුකල ගලි බවුසර් ව්‍යාපෘතිය හා ඒ අවට වගාබිමක් සැකසීමේ ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව එතුමාට සිය ප්‍රශංසාව පල කල ගරු මන්ත්‍රීතුමා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය රෝහල් දියුණු කිරීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර අදාල අංශයන්ගෙන් ප්‍රතිපාදන ලබා ගැනීමෙන් එම සංවර්ධනයන් සිදු කිරීමට ගරු සභාපතිතුමාට හැකියාව පවතින බැවින්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

කහවත්ත වතු සමාගමට අයත් රබර් කිරි කැපීම සිදු නොකරන රබර් කට්ටි කැලෑවට ගොස් ඇති බැවින් ඒවා ප්‍රදේශයේ රබර් කිරි කැපීමට හැකියාව ඇති පුද්ගලයින් වෙත ලබාදීමේ වැඩසටහනක් වතු අධිකාරි සමග සාකච්ඡා කර ගිවිසුම් ගත වීමෙන් හෝ බදු පදනම මත ලබා දීමේ වැඩ සටහනක් සකසන ලෙස සඳහන් කල ගරු මන්ත්‍රීතුමා, මැටිහක්වල, හල්ලින්න මාර්ගය කිසිදු ආයතනයක් මඟින් සංවර්ධනය සිදු කිරීම සඳහා නොපෙළඹෙන බැවින් එම මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයට පත්වී ඇති බවත්, ඒ මාර්ගයේ ගොඩගසා ඇති ඒබීසී අතුරා ගමන් කල හැකි ආකාරයට මාර්ගය සකසා දෙන

ලෙස පැල්මඩුල්ල විධායක ඉන්ජිනේරු දැනුවත් කරන ලෙස වැඩිදුරටත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 9.11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය

හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ අකල් වියෝව හේතුවෙන් පුරප්පාඩු වූ තනතුර සඳහා තමන් පත්වූ බවත්, එතුමා සිහිපත් කර එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කල ගරු මන්ත්‍රීතුමිය, තමන් නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතිහාසය පිළිබඳව මෙම අවස්ථාවේදී කෙටි හැඳින්වීමක් ගරු මන්ත්‍රීතුමිය විසින් සිදු කරන ලදී.

තවද, ප්‍රාදේශීය සභාව ජනතාවගේ සුබවිහරණය උදෙසා කටයුතු සිදුකරනු ලබන ආයතනයක් වන අතර මෙම ප්‍රාදේශීය සභාව පෙර පැවැති තත්ත්වය සමඟ සසඳන කල මේ දක්වා සිදුකර ඇති සංවර්ධනය සම්බන්ධයෙන් දරන්නා වූ දේශපාලන මතය, පක්ෂය කුමක් වුවත් ගරු සභාපතිතුමා සිදුකර ඇති මෙහෙවර ඇගයීමට ලක් කල යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමිය තමන් මෙම සභාවට පත් කිරීම සඳහා සහය ලබාදුන් රත්නපුර දිස්ත්‍රික් නායක අතුල කුමාර අහුබද්ද මැතිතුමාත්, රක්වාන ආසන සංවිධායක කණිෂ්ක මැතිතුමාත්,හිටපු ප්‍රාදේශීය සභා උප සභාපති අනෝමා වඩුගේ මැතිතුමියත් ඉතා ගෞරවයෙන් සිහිපත් කලාය.අවසාන වශයෙන් මෙම අවස්ථාවට තමන් ඉතා සුහදව පිළිගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයටත් සිය ස්තුතිය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමිය ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉතා සහයෝගයෙන් දිරි කටයුතු සිදු කිරීමට තමන් කැපවෙන බව ප්‍රකාශ කළාය.

### සභා රැස්වීමේ නිමාව

නවක මන්ත්‍රීතුමියට සභාවේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට සිය සුබ පැතුම් එක් කල ගරු සභාපතිතුමා රටේ ඇතිවී ඇති තත්ත්වය කුමක් වුවත් විශාල කැපකිරීමක් සිදු කරමින් සභා බල ප්‍රදේශය තුල ජනතාවගේ සුබ විහරණය උදෙසා තමන් ඇතුළු සියලු ගරු මන්ත්‍රීතුමන්ලා කැපවී කටයුතු කරන බවත්, අනාගත පරපුරට යහපත් රටක් නිර්මාණය කිරීමට තමන් ඇතුළු දේශපාලන අධිකාරියටත් රාජ්‍යය නිලධාරීන්ටත් විශාල වගකීමක් ඇති බැවින් සියලු දෙනා එක්ව සහයෝගයෙන් ඉදිරි කටයුතු සිදු කළ යුතු බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා , අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් දහවල් 12.45 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව